

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **55 වන කාණ්ඩය** | **බු.ව. 2556 බිනර මස පුරපසළොස්වකදා ක්‍රි.ව. 2012 සැප්තැම්බර මස 29 වන දා** | **05 වන කලබ** |

# මව්පියනට ආයාචනයක්

''....මෙතැන් පටන් පස්හැවිරිදි වයස් බෞද්ධ දරුවන්ට ආර්ය චාරිත්‍ර ඉගැන්වීමට බෞද්ධ දෙමව්පියන් විසින් තදින් සිත්වලට ගත යුතු යි. දුටු ගැමුණු කාලයේ සිංහලයන් මෙන් ශූර වීර සිංහල පරම්පරාව ප්‍රකෘතිමත් කිරීම ඕනෑ. බාලවයසේ පටන් අපේ සිංහලයන්ට මැසි, මදුරු, සීත, සුළං ආදියෙන් පැමිණෙන අන්තරාය වලින් පරෙස්සම් කොට රස ආහාර කන්න දී, පවිත්‍ර වස්ත්‍ර අන්දවා පස්පව් දස අකුසල් වලින් වෙන් වීමට නිතර කියා දී, හරක් මස්, ඌරු මස්, කරෝල, ජාඩි, උම්බලකඩ කන්ට නොදී සුරුට්ටු, දුම්කොළ, මත්පැන් බොන්ට නොදී බ්‍රහ්මචාරී ලීලාවෙන් හැදීම කටයුතුයි. දරුවන් උදෙසා මවුපියන් විසින් මනා ආදර්ශ පෙන්වීම යුතුයි. සුරුට්ටු, දුම්කොළ, මත්පැන් බීම, ඌරු මස් , හරක් මස් ආදී මස් කෑම අත්හැර දමා දඹදිව චාරිත්‍රානුකූලව ගමන් කරන්ට දෙමව්පියන්ගෙන් ඉල්ලමි. මේ පරම්පරාව සුචරිතයෙහි පිහිටා ක්‍රියා කළොත් මතු එන පරම්පරාවේ දරුවෝ වඩා හොඳින් දියුණුවන්නෝ ය.''

**- ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා**



# හොඳ ළමයා

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක**
**මාහිමිපාණන් වහන්සේ**

අම්මට තාත්තාට කීකරු ඔවුන් කීදේ එවෙලේ ම කරන, එපා යැ කී දේ එවෙලේ ම අත්හරින අම්මාට තාත්තාට ආදරය ඇති දූ හෝ පුතා හොඳ ළමයෙකි.

අම්මා හෝ තාත්තා අඬගැසූ විට එක වරින් ම එන, දෙවරක් අඬ ගසන තෙක් නො ඉන්නා වෙස්සන්තර රජ්ජුරුවන්ගේ දුව හා පුතා වගේ නිතර ම අම්මා තාත්තා සතුටු කරන දූ හෝ පුතා හොඳ ළමයෙකි.

උයද සවස තුනුරුවන් වැඳ අම්මාට තාත්තාටත් වඳින, පස් පව් නොකරන දූ හෝ පුතා හොඳ ළමයෙකි.

කුඹියකුට මැස්සකුට මදුරුවකුට වත් හිංසා නොකරන ගෙදර ඉන්න බල්ලාට පවා ආදරය කරන මෙහෙකරුවන්ට වද නොදෙන අයියා අක්කා නංගි මල්ලී ආදී ඇතුළත් පිරිසට ඉතාම ප්‍රේම කරන, කවදාවත් ඔවුන් සමඟ තරහා නොවෙන දූ හෝ පුතා හොඳ ළමයෙකි.

දුටු දුටු දේ ඉල්ලා නොහඬන, අම්මා තාත්තා දුන් දෙයෙකින් සතුටු වන, දුන් දෙයක් ම කන බොන, යම් යම් දේ අවුස්සන්නේ අදින්නේ නැති, බිත්තියේ හෝ ඇඳ පුටු ආදියෙහි ඉරි නාදින, තැන්පත් දූ හෝ පුතා හොඳ ළමයෙකි.

ඇඳුම් පැළඳුම් මුත් අතපය ත් දත් සහ නියපොතුත් පිරිසිදුව තබා ගන්නා, ඉතා ම අඩුවෙන් කතා කරන, තමාගේ පාඩම් ආදි කටයුතු නියම වෙලාවට හොඳින් කරන, ගුරුවරයාටත් පොත පතටත් ගෞරව කරන දූ හෝ පුතා ළමයෙකි.

දවසක් පාසා ගුණයෙන් නුවණින් උගත් කමින් දියුණු වෙන්ට නිතර ම හිතන, උසස් බලාපොරොත්තු ඇති, හොඳ නම නිතර රැක ගන්නා පවුලේ නම්බුව තබන දූ හෝ පුතා හොඳ ළමයෙකි.

**''සිතුමිණ'' 1945 ජූනි 24**

---

ලොව ඇත්තන් නුවණින් විමසා දැක
හිත නැත්තන් යයි නොසිතා වෙනසක
ගුණ ඇත්තන් ගුණකීම නොවී සැක
නුවණැත්තන් පින් කරන උපායෙක

ගොඩ ලමිනේ සත්වග බව දුකිනේ
ගෙනනිවනේ සිටුවන තුටු මතිනේ
තුනුරුවනේ ගුණ සිහිකළ සතුනේ
නැත විඳිනේ දුක් සසරෙහි ඉතිනේ

**(ලෝවැඩ සඟරාව 119-120 කවි)**



# සිදුහත් බෝසත් චරිතයෙන් ලද හැකි පරමාදර්ශ

**මහාචාර්ය පූජ්‍ය මීගොඩ පඤ්ඤාලෝක ස්වාමීන් වහන්සේ**
විසින් ලියන ලද ලිපියකි

සිදුහත් බෝසතුන් ගේ තුරුණු විය පිළිබඳ විස්තර රැසක් පෙළ ග්‍රන්ථයන්හි සඳහන් වේ. ඒ අතර, මහාවග්ග පාළිය හා මජ්ඣිම නිකායගත සූත්‍ර අතර මහාසීහනාද සූත්‍රය, අරියපරියේසන සූත්‍රය, සංගාරව සූත්‍රය ද වේ. එසේ ම සුත්ත නිපාතයේ පබ්බජ්ජා සූත්‍රයේ ද විස්තර ඇතුළත් වේ.

මිනිස් ජීවිතයේ තුරුණු විය වනාහි ඉන්ද්‍රියන් ප්‍රසන්න ලෞකික සැප සම්පත් කරා සිත ඇදීයන නව කාල පරිච්ඡේදය වේ. එහෙත් සිදුහත් කුමරු ගිහි ගෙය අතහැර ගියේ නව භද්‍ර යෞවන වියේ දී ම ය. සිදුහත් කුමරු මවුපියන් හඬද්දී ම ගිහි ගෙය අතහැර ගිය බව අරියපරියේසන සූත්‍රයේ සඳහන් වේ. බොහෝ තැනක සඳහන් වන්නේ මාපියනට නොදන්වා රහසිගතව ගිය බව ය.

ජීවිතය පිළිබඳව ගැඹුරින් සිතන්නට තමන් යොමු වූයේ මිනිස් ජීවිතයේ අවස්ථාවන් වන මිනිසා කවරාකාරයෙන් ජීවත් වුව ද රෝගී බවට පත්වීම, මහලු වීමට පත්වීම, ජරාවට ගොදුරු වීම, මරණය කරා එළැඹීම යන කරුණුවලට මුහුණ දීමෙන් වැළකී සිටිය නොහැකි බව පැහැදිලිව වටහා ගත් තරුණ සිදුහත් බෝසතාණෝ මිනිසා සිතන පතන සියල්ල අපේක්ෂිත ලෙස සියල්ල මොහොතින් මොහොත වෙනස්

වීමෙන් මිනිසා කරා සංවේගය, කළකිරීම, සන්තාපය ඇතුළත් දුක්ඛතාවට මුහුණ දීමට සිදුවන බවත් අවබෝධ කර ගත්හ.

මෙම දුක්ඛතාවට ශක්තිමත් ලෙස මුහුණ දිය හැක්කේ කෙසේ ද යන්න ගැන තරුණ සිදුහතුන් බොහෝ දුරට කල්පනා කළේ ය. ලොව යමක් විද්‍යමානව පවතින්නේ කවර ශක්තියක් නිසාදැයි විමසා බැලූ සිදුහත් කුමරුට කිසියම් හේතු කිහිපයක් එකතුවෙන් හට ගන්නා ඵල ධර්මයක් ලෙස විද්‍යමාන වන දෙය පවත්නා බව වටහාගත හැකි විය. අනතුරුව කල්පනා කළේ එහි ශක්තීන් මඳ කලක් විද්‍යමාන වීම කෙරෙහි බලපවත්නා හේතු කවරේද යන්න ගැන ය.

ඒ අනුව සන්තානයෙහි හට ගන්නා දුක වනාහි මමත්වය මුල්කරගත් තෘෂ්ණාව මුලකොට පවත්නා බව වටහා ගත හැකි විය. ලොව යමක් විද්‍යමාන වන්නේ නම් එහි යම් විටක අනිවාර්යයෙන් නැති වීමක් ද තිබිය යුතු යැයි තර්කානුකූලව කල්පනා කළ තරුණ සිදුහත් කුමරා දුකෙහිද නැතිවීමක් තිබිය යුතු බව නිගමනය කළේ ය. එය නැවැත්වීමට නම් හේතු නතර විය යුතු බව තේරුම් ගත් එතුමා තෘෂ්ණාව නොමැති විට දුක නොපවත්නා බව ද තේරුම් ගත්තේ ය.

එහෙත් බරපතල ගැටලුව වූයේ එම තෘෂ්ණාව නැති කරගත හැක්කේ කෙසේ ද යන්න ය. පිළිල වැලක් කපා දමූවිට එය නැවත නැවතත් වැඩී ඉස්මතු වන්නාක් මෙන් මිනිස් සිතෙහි නැවත නැවතත් තෘෂ්ණාව හටගන්නා බව සිදුහතුන්ට වැටහිණ. ගිහිගෙය තුළ සිට එහි තෘෂ්ණාව නැති කිරීමේ අසහාය මඟ සොයා ගත නොහැකි ය යන හැඟීම නිසා සියලු ලෝසතුන් දුකින් මුදවා ගැනීමේ උදාර අපේක්ෂාවෙන් උන්වහන්සේ ගිහිගෙය අතහැර ගියහ.

මේ දක්වා සිදුහත් චරිතය පිළිබඳව කරුණු විමසා බලන විට තරුණ සිදුහත් කුමරු සමකාලීන සමාජයේ මුල්බැස තිබුණු නිර්මාණවාදී හැඟීම් සපුරා බැහැර කරමින් මිනිසා හා

සත්ත්වයා පිළිබඳව විචාරශීලි නව දෘෂ්ටිකෝණයකින් බැලීමේ උනන්දුව ඇති කරගත් බව පැහැදිලි වේ.

## ආර්ය පර්යේෂණය

ලොව යථාර්ථ සත්‍යය කුමක් ද යන්න සෙවීම පිණිස උන්වහන්සේ සිය සියලු සැප සම්පත් හැර දමා තවුස් දිවියට ඇතුළත් වූහ. මෙහි දී තරුණ සිදුහත් කුමරාට මුහුණදීමට සිදුවූයේ නුහුරු නුපුරුදු කටුක දිවි පෙවෙතකට ය.

එහෙත් අධිෂ්ඨානශීලි වූ හෙතෙම ඒ සියල්ලට ධෛර්ය සම්පන්නව මුහුණ දීමට තරම් ශක්තිමත් විය. තරුණ බෝසත් සිදුහතුන් විසින් සිදු කරන ලද විමුක්ති ගවේෂණය අරියපරියේසනය ලෙස හැඳින්වේ.

මෙහි දී සත්‍ය සොයා ගැනීම සඳහා අනුගමනය කරන ලද දුෂ්කර වූ විවිධ චර්යාවන් පිළිබඳව මජ්ඣිම නිකාය මහා සීහනාද සූත්‍රයෙහි දීර්ඝ වශයෙන් කරුණු විස්තර කර තිබේ. ආහාර පාන ගැනීම සපුරා අඩු කළ එතුමා ක්ලාන්ත වී බිම ඇද වැටෙනතෙක්ම අධිෂ්ඨානශීලීව එම ක්‍රියාමාර්ගය අත්හදා බැලීමෙහි යෙදුණේ ය.

බුද්ධිමත් තරුණයකු ලෙස සිදුහත් තවුස්තුමා කෙරෙහි පැවැති ගවේෂණශීලිත්වය හා සත්‍යය සෙවීමේ අභිලාෂය මෙහි දී කැපී පෙනේ. එසේ ම සත්‍ය සෙවීමේ අධිෂ්ඨානය සහ ඒ පිළිබඳ වූ දැඩි කැප කිරීම කෙබඳු වූවක් ද යන්න ද මෙහි දී පැහැදිලි වේ. එක් එක් තාපස චර්යාවන් අනුගමනය කොට එහි තමන් සොයන නිවීම, දුකෙහි සංසිඳීම නොමැති බව දත්විට කිසිදු අයුරකින් අධෛර්යයට පත් නොවූ හ. අවසන් වරට බෝසතුන් මැදි පිළිවෙත අනුගමනය කරමින් බෝ සෙවණෙහි වැඩ සිටියේ සම් මස් නහර ඇට වියළී සිඳී ගිය ද බුදු වී මිස නොනැගිටිමි යි යන ශ්‍රේෂ්ඨ අධිෂ්ඨානයෙනි.

අධිෂ්ඨානශීලීව කැපවීමකින් ක්‍රියා කරන ලොව කවර මිනිසෙකුට වුව ද ස්වකීය අපේක්ෂා මුදුන් පත්කර ගනිමින් ජීවිතය ජයගත හැකි බව තරුණ බෝසත්තුමාණෝ ලොවට හෙළි කළහ. මෙම ක්‍රියාදාමය අනුගමනය කිරීමේ දී එතුමා තුළ වූයේ තමා පමණක් විමුක්තිය ලැබ සැපවත් වීමේ අදහස නොවේ. සැබවින් ම බෝසතුන් උදාර කැපවීමක යෙදුණේ ලොව සියලු සතුන් දුකින් මුදවා ගැනීමේ උදාර කාරුණික අධ්‍යාශයෙනි. තුරුණු වියේදී ම සිදුහතුන් තුළ ජනිත සත්ත්ව හිතවාදිත්වය හා දයාව කෙබඳු වූවක් ද යන්න එයින් පැහැදිලි වේ.

ලොව මිනිස් වර්ගයා අන්ධානුකරණයෙන් යුතුව ගතානුගතික අදහස් පිළිගෙන එක් මිනිසෙකු තවත් එබඳුම මිනිසකු ගේ දාසයකු හෝ වහලකු ලෙස සැලකීමේ ඇති සාවද්‍යතාව සහ නිර්දය ස්වභාවය ලොවට පැහැදිලි කරදීම උන්වහන්සේ ගේ එක් අභිලාෂයක් වූයේ ය.

## ලොව පරමාදර්ශී උදාර මිනිසා

එය සාමාන්‍ය තරුණයකු ලෙස සමාජයට ප්‍රකාශ කරන ලද්දේ නම් කිසිවකුත් විසින් නොසලකා හරිනු ඇත. මේ නිසා බෝසතුන් ප්‍රථමයෙන් තමන් සත්‍යය වටහාගෙන යථාර්ථ සත්‍ය වටහාගත් ක්‍රියාමාර්ග අනුගමනය කළහ. තමන් වහන්සේ සමාජ පිළිගැනීමට පාත්‍ර වූ පසුව ලොවට සත්‍යය හෙළිකරමින් මානව භාවයේ පවත්නා උත්තරීතර අගය හා එය උසස් බවට පත් කරගතහැකි ඒකායන මාර්ගය ද කියා දුන්හ.

මුල් යුගයේ දී සත්‍යය වටහා ගත්තේත් එයට කන් යොමු කළේත් දහසකට එක් අයෙකු තරම් සුළු පිරිසක් පමණි. එහෙත් ස්වල්ප කලකදී බුද්ධිමත් ජනතාවගේ අවධානය වේගයෙන් උන්වහන්සේ වෙත යොමු වන්නට විය. මුල් යුගයේ දී තමා

කිසිවකුන් විසින් නොසලකා හරින ලද්දේ යැයි කම්පිත නොවූහ. උපක ආජීවකයා ද පස්වග තවුසන් විසින් ද ප්‍රථම අවස්ථාවේ එතුමන් නොසලකා හරින ලද බව මහාවග්ග පාළියෙහි සඳහන් වේ.

ආරම්භක අවදියේ දී උන්වහන්සේ වටා ඒකරාශී වූයේ සත්‍යකාමී තරුණ පිරිස් බව පැහැදිලි ය. යස ඇතුළු තරුණ පිරිස, භද්දවග්ගිය කුමාරවරු, උපතිස්ස කෝලිත ඇතුළු තරුණ පිරිස, ශාක්‍ය කෝලිය දෙපරපුරේ තරුණ පිරිස් ආදිවශයෙන් විශාල තරුණ පිරිසක් විමුක්තිකාමීන් වශයෙන් උන්වහන්සේ වටා ඒකරාශී වූහ.

ලොව උත්තරීතර ප්‍රබුද්ධතාව සාක්ෂාත් කර ගත් විශිෂ්ට ප්‍රඥාවේ උපරිම තලය කරා එළැඹි උන්වහන්සේ එතෙක් එම දුෂ්කර ගමන් මග ගෙවූ, තුරුණු වියේදී ම ලොව යථාර්ථය හඳුනා ගනිමින් ලොව පරමාදර්ශී උදාර මිනිසා වීමේ භාග්‍යය ලදහ.

ආත්මාර්ථය මුල් කොට ධන කාමයෙන් මත්ව, ලොව අහිංසක මිනිස් වර්ගයාගේත් මිනිසා අවට පරිසරය තුළ වසන සියලු ආකාර ජීවීන්ගේත් වටිනා ජීවිත ව්‍යසනයට පත් කරමින් රුදුරු ලෙස ආත්මාර්ථකාමීව ක්‍රියා කොට දුකසේ ලත් මිනිස් ජීවිතය අඳුරු අගාදයක් බවට පත්කර ගන්නා ඉක්මන් තරුණ මිනිස් පරපුරට තරුණ සිදුහතුන් ගේ ජීවිතය පරමාදර්ශයකි. එතුමන් තුළ වූ අධිෂ්ඨානශීලීත්වය, කැපවීම, උත්සාහය, අකම්ප්‍ය ලක්ෂණය ආදී මානව ගුණ සමුදාය මිනිස් පරපුරට උදාර ආදර්ශයකි. යමෙක් එය අනුගමනය කරන්නේ නම් හෙතෙම බෝසතෙක් ද වන්නේ ය.



# සත්පුරුෂ ධර්ම සත

සිරි වජිරාරාම දහම් පාසලේ ආදි ශිෂ්‍යා
**සඳුලි ජයවර්ධන මහත්මිය විසිනි.**

සක්දෙව් රජ මනුෂ්‍ය ආත්මභාවයෙහි වාසය කරන කාලයෙහි සප්ත වතපද හෙවත් සත්පුරුෂ ධර්ම සමාදන්වී සිටියේ ය. ඒ ගුණ හේතුකොට සක්දෙව් රජවූ බව බුදුරජාණන් වහන්සේ වදාළහ.
ඒවා මෙසේ යඃ

1. ජීවිතාන්තය දක්වා පවුලේ වැඩිහිටියන්ට සැලකිලි ගෞරව දැක්වීම
2. ජීවිතාන්තය දක්වා මොළොක් ප්‍රියවචන කතා කිරීම
3. ජීවිතාන්තය දක්වා අනුන් බිඳවන කේලාම් කීමෙන් වැළකී සිටීම
4. ජීවිතාන්තය දක්වා මසුරුමල දුරුකොට දන්දීමෙහි, බෙදා දී වැළඳීමෙහි ඇලී වාසය කිරීම
5. ජීවිතාන්තය දක්වා සත්‍ය වචන කීමෙහි ඇලී වාසය කිරීම
6. ජීවිතාන්තය දක්වා නොකිපෙන ස්වභාවයෙන් යුතුව වාසය කිරීම, ප්‍රමාද දෝෂයකින් කෝපයක් ඇති වුවහොත් එය වැඩීමට ඉඩනොදී වහාම දුරලීම

මෙම කාරණා හත පිළිපැදීම ලොකු පොඩි කාහටත් ඉතා අගනේ ය. මවුපියන්ට වැඩිහිටියන්ට සැළකීම, බොරු කීමෙන් කේලාම් කී-මෙන් වැළකීම, ප්‍රිය වචන කතා කිරීම, පරිත්‍යාගශීලි බව, නොකි-පෙන ස්වභාවය ජීවිතයකට අවශ්‍ය වටිනා ගුණදහම් ය. මේ ගුණ තමා තුළ පිහිටවා ගැනීමෙන් මෙලොව දියුණුව සැලසෙන අතරම නොලැබිය හැකි අනෙක් සම්පත්තියක් නැතැයිද කිව හැකි ය. ඒ නිසා මේ අනුව කටයුතු කරන්නට අපි කවුරුත් සිතට ගනිමු.



# බුදු සිරිතින් බුදු වදනක්

කොස්ගම බොල්ලතාව ශ්‍රී සුභද්‍රා දහම් පාසලේ උප ප්‍රධානාචාර්යානී
**ශාස්ත්‍රපති එච්. එම්. සුජාතා නාලිනි මහත්මිය විසිනි.**

මෙලොව වසන මිනිසුන් අතරින් කතා කිරීමේ හැකියාව, වාසනාව ලබා ඇති එකම සත්ත්වයා මිනිසා. ඒ වුවත් බොහෝ දෙනා කතා කිරීමේ කලාව, එනම් කතා කළ යුත්තේ කුමක්ද කෙසේද කාටද  කියා හඳුනා ගන්නේ නැහැ. එනිසා බොරු කියා කෙනෙක් රවටනවා. රළු නපුරු ගොරෝසු වචනින් කෙනෙකුගේ හිත රිදවනවා. සමගියෙන් සාමයෙන් සිටින දෙන්නකුගේ හිත් බේදකරවන කේළාම් කියනවා. ඒ වගේම තමන්ටත් අනුන්ටත් පලක් නැති, එලොවටත් මෙලොවටත් පලක් නැති හිස් ප්‍රලාප වචන දොඩමින් වටිනා කාලය කා දමනවා.

බුදුරජාණන් වහන්සේ ගේ දේශනාවට අනුව බොහෝ සේ කතා කළ පමණින් ම ඔහු පණ්ඩිතයකු හෝ ධර්මධරයෙකු හෝ වන්නේ නැහැ. ඒ වගේම නිහඬව සිටි පමණින් ඔහු මුනිවරයකු වන්නෙත් නැහැ.

එසේනම් අප කතා කළ යුත්තේ කෙසේ ද? මොනවා ද? මේ බව බුද්ධ චරිතයෙන් විමසා බලමු.

වරක් අභයරාජ කුමාරයා සමඟ සංවාදයක යෙදුණු බුදුපියාණන් වහන්සේ, තමන් වහන්සේ වදන් පවසන්නේ,

දුකටපත්, අසරණ භාවයට පත්, සත්ත්වයන් ගේ දුක නිවීමට, ඔවුන් ගේ දුක නිවා ඔවුන් සැනසිල්ලට පත් කිරීමට බවත්, තමන් වහන්සේ කතා කරන්නේ තැන නොතැන නියම වශයෙන් දැනගෙන බවත් වදාළා.

ඒ අනුව උන්වහන්සේ ගේ කතා කලාව අවස්ථා හයකට බෙදා දක්වන්න පුළුවන්.

1. අසත්‍ය නම්, පදනමකුත් නැති නම්, කිව්වොත් අයහපතක් ම වන්නේ නම්, අසන්නාට අප්‍රිය අමනාප වදනක් නම් තථාගතයන් වහන්සේ එබඳු වදන් පවසන්නේ නැහැ.
2. කතා කරන වචන සත්‍ය වුවත්, පදනමක් ඇතත්, ඒ වචනයෙන් අයහපතක් වන්නේ නම් අසන්නා එයින් ප්‍රිය මනාප බවක් ලබන්නේ නැතිනම් එබඳු වදන් දේශනා කරන්නෙත් නැහැ.
3. සමහර වදන් ඇත්තයි. පදනමකුත් තිබෙනවා. කීමෙන් යහපතක් වගේ ම අර්ථයකුත් සිදු වෙනවා. නමුත් අසන්නා එයට ප්‍රිය මනාප වෙන්නේ නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේ අවස්ථානුකූලව, ස්ථානෝචිතව එබඳු වදන් දේශනා කරනවා.
4. කෙනෙක් කතා කරන සමහර වදන් අසත්‍යයි. පදනමකුත් නැහැ. ඒ වචන කතා කිරීමෙන් වෙන්නේ අනර්ථයක්. ඒවා ඇසීමට බොහෝ දෙනා ප්‍රිය කරනවා. මනාප වෙනවා. ඒ වුණත් බුදු පියාණන් වහන්සේ එවැනි වදන් දේශනා කරන්නේ නැහැ.
5. කෙනෙක් පවසන වචන සත්‍යයි. පදනමක් තිබෙනවා. නමුත් කිව්වොත් වෙන්නේ අයහපතක්. ඒ වුණත් ඒ වගේ වචන අසන්නට බොහෝ දෙනා ප්‍රිය මනාප වෙනවා. බුදුපියාණන් වහන්සේ එබඳු වදන් දේශනා කරන්නේ නැහැ.

6. සමහර වදන් සත්‍යයි. පදනමක් තිබෙනවා. කිව්වොත් යහපතක් ම වෙනවා. බොහෝ දෙනා ඒවා අහන්න ප්‍රිය මනාප වෙනවා. තථාගතයන් වහන්සේ එබඳු වදන් ම දේශනා කරනවා. ඒ දේශනාවන්ගෙන් බොහෝ සත්ත්වයින්ට සෙතක් යහපතක් අර්ථයක් ම සිදුවෙනවා.

මේ අනුව අපිත්, කතා කළ යුත්තේ කුමක් ද? කෙසේ ද? කාට ද? අප මේ කතා කරන්නේ කියා විමසිල්ලෙන් යුතුව, පරිසරය හඳුනාගෙන තෝරා බේරා ගෙන අර්ථවත් වචන කතා කිරීමට උත්සාහ කරමු.

යමකුට අනර්ථයක් වන වචන දාහක් කතා කරනවාට වඩා, යමක් ඇසීමෙන් යමකුගේ දුක් වේදනා සංසිඳේනම් නිවන් මඟට යොමු කෙරේ නම් එබඳු එක වචනයක් කතා කිරීම ම උසස් කොට සලකා එබඳු අගනා එක දහම් පදයක් (ඒකං ධම්මපදං සෙය්‍යෝ) කතා කිරීමට උත්සාහ කරමු. එයින් අනුන්ට වගේ ම අපටත් යහපතක් සැළසෙන බව අවබෝධ කර ගනිමු.



# මඩිහේ මහනාහිමි හරසරණිය

අමරපුර ධර්මරක්ෂිත නිකායාභිවෘද්ධි දායක සභාවේ ලේකම්,
කොළඹ සාසන සේවක සමිතියේ සම ලේකම්
**මහේන්ද්‍ර වී. විජේතිලක මහතා**



මෙම බෞද්ධ ළමයා සඟරාවේ නිර්මාතෘවරයාණන් වහන්සේ වූ, 1955 සැත්තැම්බර් 21 වන දින අපවත් වී වදාළ කොළඹ බම්බලපිටියේ සිරි වජිරාරාමයේ නිර්මාතෘ අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහා නාහිමියන් වහන්සේට උපහාරයක් ම වේවා !

මෙම නාහිමියන්ගේ ශිෂ්‍ය රත්නයක් වූ වජිරාරාමාධිපතිව වැඩ විසූ අග්ගමහා පණ්ඩිත අතිගරු මඩිහේ පඤ්ඤාසීහ

මහානායක හාමුදුරුවන් වහන්සේගේ සංකල්පය වන "මිනිහා නොහදා රට හදන්න බෑ - මිනිසාත් හදාගනිමින් රටත් හදමු" යි යන පාඨය කුඩා ළමයාගෙන් පටන්ගෙන වැඩිහිටි පාලකයන් දක්වා සිතේ තදින් ම සනිටුහන් විය යුතුයි.

සිරි වජිරාරාමයෙහි වැඩ විසූ වියත් මාහිමියන් වහන්සේලා නිරතුරු ව කුඩා ළමයිනට අවවාද අනුශාසනා ගද්‍යයෙන් හා පද්‍යයෙන් වදාළ සේක. පැළෑණේ මහානායක හාමුදුරුවන් වහන්සේ හා මඩිහේ මහා නායක හාමුදරුවන් වහන්සේ දන්නා දෙයින් නොදන්නා දෙයට (Known to unknown) යන ක්‍රමවේදයට ළමයින්ට හුරු (දත්ත) උදාහරණ ගෙන හැර දක්වමින් ළමයාගේ හැදීමටත් මිනිසා (මානවයා) ගේ උන්නතියටත් රටේ සෞභාග්‍යයටත් පැදි රචනා කළ සේක.

ඉන් කිහිපයක් නම් :-

"කරතොත් කරපන් හරියට
බැරි නම් පලයන් අහකට"

''වීරිය දිරි ගුණ දරුවෝ - කාරිය කරනට සූරුවෝ
සූරිය සරි තෙද ගරුවෝ - ආරිය සිංහල දරුවෝ ''

අග්ගමහාපණ්ඩිත මඩිහේ මහනාහිමිපාණන් වහන්සේ කුඩා ළමයෙකුට පියෙකු විසින් දරුවාගේ මනස වර්ධනයට පැනයක් වශයෙන් දෙන ලද ගැටලුවක් මෙසේ සඳහන් කළ සේක.

''පියා තම කුඩා දරුවාට නොපෙනෙන සේ කොලයක එක පැත්තක ලෝක සිතියමක් ගෙන එහි අනික් පැත්තේ මිනිහෙකුගේ රූපයක් ඇඳ එය කෑලි කෑලි වලට කතුරෙන් කපා තමන්ගෙ කුඩා පුතා කැඳවා පුතේ, මේ කොළ කෑලිවල තියෙන ලෝක සිතියම හදන්න කියා දුන්නා.

කුඩා ළමයා ලෝක සිතියම හදා ගත නොහැකිව කල්පනා කරමින් සිටින විට කොළයේ අනිත් පැත්තේ සටහන් කර

තිබුණු තමන් දන්නා මිනිහා (ගේ රූපය) හදන්නැයි කීවා. පුතා එසේ කළා. මිනිස් රුවක් හැදුණා. පියාගේ නියමයෙන් කොළයේ අනෙක් පැත්ත හරවා බැලූ විට ලෝකසිතියම හැදී තිබුණා. මිනිසා හැදුණාම ලෝකය ඉබේටම හැදෙන බව පියා සඳහන් කළා.''

මඩිහේ මහා නාහිමියන් වහන්සේ දූරදර්ශී නුවණින් ඉහත සඳහන් කල සංකල්පය මුළු ලොවටම දායාද කර දුන් සේක.

කුඩා දරුවනට මැනවින් පැහැදිලි වෙන අයුරින් මෙම සිරි වජිරාරාම විහාරාධිපති වහන්සේලා එදත් අදත් ගද්‍යයෙන්, පද්‍යයෙන් හා ධර්මයෙන් දෙලොවට වැඩ දායක දෑ ප්‍රකාශ කර සිටින සේක.

වර්ෂ 9 කට පෙර සැප්තැම්බර් මස 8 වන දින අපවත්වී වදාළ අග්ගමහාපණ්ඩිත මඩිහේ නාහිමියන් ගේ 2013 ජුනි 21 වන දිනට යෙදෙන ජන්ම ශත සංවත්සරය වෙනුවෙන් මහානාහිමි ප්‍රතිමාව පසුගිය 8 වන දින මාතර නගර මධ්‍යයේ දී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ සිරිමතාණන්ගේ සුරතින් නිරාවරණය වූ පසු පැවති උත්සව සභාවේදී මහා සංඝරත්නය ඇතුළු ගරු ජනාධිපතිතුමා හා ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමාගේ කතාවලින් මේ සංකල්පය රටේ හා ලොවේ උන්නතියට පෙළ ගැසී ඇති ආකාරය මැනවින් ප්‍රකාශ කළ සේක.

දරුවනි, බෞද්ධ ළමයා කියවීමෙන් හා මෙවැනි උදාර පින්වත් චරිත ගැන පරිශීලනය කිරීමෙන් තමන්ගේ අගුණ දුර්වලකම් අඩුකරගෙන ගුණධර්ම වැඩි කරගෙන දෙලොවට සඵලදායී හොඳ මිනිසෙකු වීමට අදිටන් කරගන්න.

# Maha Nayanka Thero

Unforgotten sages of countless ages
Have preached their wisdom in many places,
And all of their insights still proven true
Were in the past but move on too.
But was any sage so great a teacher
a guiding leader, so kind to all?
Whose tender soul and infinite love
Could bring the light to endless dark?
With the kindest heart and
limitless care
To humanity he always shared.
And despite the impermanence of
nature's ways
In our hearts he shall forever stay:
Madihe Maha Nayaka Thero,
Magnificent, Incredible,
extraordinary;
A true reverend and hero.



**Chathuri Wickramaratne**
Houston Buddhist Vihara
Dhamma School
Texas, USA



# නමස්කාර වේවා සඟ රුවනට

**ජයසුමනා ද සිල්වා රොබට්සන් මහත්මිය විසිනි**

සසුන් ලැදි පුතා :

දසමාසේ උරෙ කත්වා - පොසේසි වුද්ධි කාරණං
ආයුදීඝං වස්සසතං - මාතු පාදං නමාමහං

මව්තුමිය : මගේ බුදු පුතාට තුනුරුවන් ගේ සරණයි නීරෝගී සැපතම ලැබේවා

පුතා : මගේ ආදරණීය අම්මා මම අම්මට පොඩි රහසක් කියන්නද?

මව්තුමිය : මගේ රත්තරන් පුතේ, මොකක්ද මගෙ පුතාට තියෙන රහස, ප්‍රශ්නේ ?

පුතා : මගේ දයාබර අම්මේ, හොඳ අම්මා වගේ මට මහණ වෙන්න අවසර දෙන්න.

මව්තුමිය : අනේ මගේ චූටි පුතේ, මොනවද මේ කියන්නේ මමයි තාත්තායි වයසට ගිහිල්ලා, ඉදිරියේ දී අසරණ වෙන අවධිය ගැන පුතාට හැඟීමක් නැද්ද?

ඒ අවස්ථාවේ දී අපව රැක බලාගන්න පුතා සූදානම් නැද්ද?

පුතා: ඇත්තට ම අම්මේ, අම්මලා රැක බලාගන්න මගේ අනිත් නංගියි මල්ලියි ඉන්නවනේ.

මව්තුමිය : මගේ රත්තරන් පුතේ මේක මහ පුදුමයක් නේද? අපි දුබල වෙනකොට අපිව අතරමං කරලා යන්න මගේ පුතාට කණගාටු නැද්ද? මගේ පුතේ ෟ

පුතා : ආදරණීය අම්මේ පරමාර්ථය උතුම් නම්, ප්‍රබල නම් මේ ලෝකයේ කිරීමට දුෂ්කර දෙයක් තිබේ ද? අම්මලා මහලු වයසේ දී පෝෂ්‍ය කිරීමට කෙනෙක් නැත්නම් මා පිඬු සිඟා ලබාගන්නා දෙයින් අම්මලගේ කුසගිනි නිවාලීමට සූදානම්. අපේ මහා කාරුණික බුදු පියාණන් වහන්සේ එවැනි වැඩ පිළිවෙලක් අනුදැන වදාරා තිබෙනවා.

මව්තුමියඃ සාධු සාධු මගෙ බුදු පුතේ ඒවා කොහොම උණත් අපි කවුරුත් ළඟ නැතිව පුතාට මහණවෙලා පන්සලේ හුදෙකලාව ඉන්න පුළුවන් ද?

පුතා : දයාබර අම්මේ, අල්ලා ගන්නා දෙයින් නොව අතහරින දෙයින්මයි අපට සතුට ලබාගත හැකි බවයි අපේ ශාන්තිනායක බුදු අමාමෑණියන් වහන්සේ දේශනාකොට වදාරා ඇත්තේ.

**''පියතෝ ජායති සෝකෝ - පියතෝ ජායතී භයං**
**පියතෝ විප්පමුත්තස්ස -නත්ථි සොකෝ කුතෝ භයං''**

මව්තුමිය : ඒ වගේම රත්තරන් පුතේ, බුදුපියාණන් වහන්සේ දේශනා කරල තියෙනවා නේද? 'පුත්තා වත්ථු මනුස්සානං' කියලා . මෙසේ සළකනකොට මනුෂ්‍යයාට ඇති ලොකුම වස්තුව දරුවන් නේද?

පුතා : ඒක එහෙම වෙනවා වගේම, අපි අපගේ අම්මා, තාත්තා සහෝදර සහෝදරියන් පවුල යනාදිය කෙරෙහි ඇති

ආදරය මුළු සත්ත්ව සමූහයා කෙරෙහිම දක්වන්නට පටන් ගත් තැනයි නියම නිදහස, සැපත ලැබෙන්නේ.

මව්තුමිය : ඉතිං මගේ පින්බර පුතේ, පුතාගේ අම්මටත්, තාත්තාටත් මගේ පුතා අනුකම්පා කරන්න, නැත්නම් කරුණාව දයාව යොමුකරන්න. නැත්නම් අපට කාගේ පිහිට ද?

පුතා : මගේ ආදරණීය අම්මේ, මම ශාසනයට ඇතුළුවෙලා ශික්ෂාකාමී, සිල්වත්, ගුණවත්, ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයෙක් උණාම, මම එක අම්මා කෙනෙකුගේ පුතෙක් නෙවෙයි. හැම අම්මලාගේ ම පුතා. එක පියකුගේ පුතෙක් නොවෙයි හැම පියෙකුගේ ම

පුතා. එවිට අම්මේ මට පුලුවන් වන්නේ කාටත් පොදුවේ මෛත්‍රී කරන්න. කරුණාව දක්වන්න. සේවය කරන්න. මෙයිට වැඩිය ලොකු දෙයක්, සැපතක්, ශාන්තියක්, භාග්‍යයක් තියෙනවද?

මව්තුමිය : ඉතින් මගේ බුදු පුතේ, පුතා කියන කරුණු කාරණා පිළිගතයුතු වුවත්, මගේ පුතාට මහණ උණාම දුක් විඳින්න වෙනව නේද ?

පුතාඃ මගේ කාරුණික අම්මේ, ඒ ඒ දේවල් තම කැමැත්තෙන් අත් හැරීමෙන් ලැබෙන සැපයට වැඩි සැපයක් මෙලොව වෙන මොන දේකින්වත් ලබාගන්නට පුළුවන් කමක් නැහැ. දේවල් සතුටු සිතින් අතහැරීමේ, නෛෂ්ක්‍රම්‍යයේ අගය අපගේ මහා කාරුණික වූ බුදු අමාමෑණියන් වහන්සේ කෙතරම් ගැඹුරින් දේශනාකරලා තියෙනවද? භෞතික වස්තූන් කෙරෙන් ලැබෙන ආස්වාදය හා ආදීනව බුද්ධ දේශනයේ මනාලෙස පැහැදිලිව වදාරා තිබෙනවා. ලෞකික සැපවලින් ලැබෙන ආස්වාදය හා ආදීනව බුද්ධ දේශනයේ මනා ලෙස පැහැදිලිව වදාරා තිබෙනවා. ලෞකික සැපවලින් ලැබෙන

ආස්වාදයට අනතුරුව ලැබෙන ආදීනව නුවණින් මෙනෙහි කොට ඥානවන්තයා නිස්සරණය දෙසට යොමු වෙනවා.

මව්තුමිය : මගේ රත්තරන් පුතාට අවවාද දෙන්නට තරම් අප තවම බුද්ධිමත් නැති බව නම් ඇත්ත. ඒත් මගේ බුදු පුතේ .....

පුතා : දයාබර අම්මේ අපි සැමවේලේම බලාපොරොත්තු වන මේ සැපත සතුට කියන දේ සිතේ පහළ වන දෙයක් මිස ඉන් බාහිර වූ දෙයක් නොවේ. යථා ලාභ සන්තුට්ඨියෙන් යුක්ත හෙවත් ලද පමණින් සතුටු වී, චාම් සරල සැහැල්ලු ජීවිතයක් ගතකිරීමට මා හිත හදාගෙන ඇත්නම් බාහිර දුෂ්කරතාවලින් මට කොහොමද දුකක් එන්නේ.

මව්තුමිය : මගේ රත්තරන් පුතේ, මගේ මේ බොළඳ ප්‍රශ්නයට පුතා කොහොමද උත්තර දෙන්නේ ? යම් යම් දිනවල මගේ පුතාට පිණ්ඩපාත දානය එහෙම වැරදුණොත් පුතාට නිරාහාරව ඉන්න පුළුවන් ද?

පුතා : අයියෝ අම්මේ, ඕකත් කණගාටු විය යුතු දෙයක් ද? වේලක් බඩගින්නේ ඉන්න එක එතරම් දුෂ්කර දෙයක් ද? කුසට ආහාර නැති උණාට පන්සලේ දී අපට මොළයට ලැබෙන ආහාරවලින් නම් අඩුවක් නැහැ නේද? බලන්න, අම්මේ සාරසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලේ දානාදි පාරමිතාවන් පුරාගෙන පැමිණි අප මහා කාරුණික බුදු අමාමෑණියන් වහන්සේට වේරන්ජාවේ දී සෑහෙන කාලයක් බෙහෙවින් ම දාන වේල වැරදුණා නම් අපි වගේ පෘථග්ජනයන් ගැන කුමන කථා ද?

මව්තුමිය : සාධු සාධු සාධු මගේ පින්වත් පුතා නම් සුදුසු බුද්ධ චීවරය පොරවා ගැනීමටයි ඒ උණත් පුතේ අපි කොහොමද පුතා ගෙදර නැති පාළුව මකාගන්නේ.

පුතා: සද්ධා සම්පන්න මගේ අම්මේ, අනාගතය ගැන සිතලා ශෝකකරන්න හොඳ නැහැ. මම මහණ වෙන්න හිතන සිතුවිල්ල ගැනම අම්ම සතුටු වෙන්න ඕන. පවුලකින් ළමයෙක් ශාසනයට දායාද කළොත් හතර වරිගෙම නිවන් දකිනවා කියලා අම්මා බොහෝවිට කියල තියෙනවා නේද?

මව්තුමිය: ඒ කතාව නම් ඇත්ත තමයි මගේ රත්තරං පුතේ, මගේ බුදු පුතාගේ අගය මොහොතින් මොහොත වැඩි වෙනවා ෟ

පුතා : අම්මේ මම මහණවෙලා ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයෙකු ලෙස කල් ගතකරන කොට අම්මට කොතරම් සැනසීමක් ද? ඒ උතුම් තත්ත්වය ආරක්‍ෂා කිරීමෙන් ලැබෙන පින් අම්මලාටත් අනුමෝදන් වෙනවා නේද? මම එක පවුලකට පමණක් සීමා නොවී මුළු සමාජයට ම ශාන්තියක් ලෙස ජීවත් වෙනවා දකිනකොට අම්මට කෙතරම් විශාල නිරාමිස ප්‍රීතියක් ලබන්නට පුළුවන් ද?

මව්තුමිය : මගේ පුතේ, මා පුතාට පෙවූ මව් කිරිවල ණය ගෙවන්නට පුතා මාව දහම් කිරිවලින් පෝෂණය කරනවා වගෙයි.

පුතා : ආදරණීය අම්මේ, අපගේ තිලෝගුරු බුදු අමාමෑණියන් වහන්සේ දෙසූ ඒ උතුම් දහම් කඳ ආරක්‍ෂා කරන මහා සංඝ සමාජයේ සාමාජිකත්වය ලැබීමට වඩා ශ්‍රේෂ්ඨ තත්ත්වයක් නිලයක් තවත් මේ මිහිපිට තිබේද?

මව්තුමිය: සාධු සාධු සාධු මගේ පුතාගේ උත්තම පරමාර්ථය එසේ මුදුන්පත් වේවා ! මගේ පුතාට බුදුබව ම ලැබේවා !



# උත්තරීතර සෙනෙහසක අසිරිය

සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමි**



මිහිමවගේ ඇකයේ
තවම දළු ලා වැඩෙන
බෝ පතක් දෙකක් ඇති
පුංචි බෝ පැළයක් ය ඔබ

නිවන නම් සසර ඉම
තරණයට බෝ දුර ය
ජීවිතය නම් ගං දියේ
පුංචි දිය බිඳක් ඔබ

දියට බස්නා කෙනෙකු හට
අත් විඳින්නට ලැබෙන
ඒ මහා බිය සතර
දැක නැතිය තව ම ඔබ

කටේ කිරි සුවඳ ඔබෙ
නැති තව ම හැර ගොසින්
බිව් කිරේ ණය හනික
ගෙවන්ට ද මේ ගමන

අන් දරුවන් කිරට හඬත
ඔබේ නැත ඒ හැඬුම්
බුදු හිමිගෙ බණ පදය
අසන්නයි පෙළ ගැසුම්

එතෙර කරන්නට හතර වරිගයම
ගෙවා යන දුර ගමන
මව් සෙනෙහසට වැඩි වූ
සෙනෙහසක්
බුදු සමිඳුගෙන් ලැබුණාද
පොඩි හාමුදුරුවනේ
ඔබට..........



# මඩිහේ මහනාහිමි චින්තනයෙන් බිඳක්

**බෝධිසත්ත්ව ආදර්ශය**

දිනක් උගත් පිරිසක් සමඟ සාකච්ඡාවෙක යෙදී සිටිනවිට, සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි ආදී වශයෙන් වෙන් කොටැ කතා කිරීම ස්වාමීන් වහන්සේලාට සුදුසුදැ' යි කෙනෙකු මගෙන් ඇසුවා. බුදුරජාණන් වහන්සේ ගේ මට්ටමෙන් නම් හොඳ නැති බවත්, උන්වහන්සේ රාහුළ කුමරුත් දෙව්දත් හිමියනුත් එකසේ සැලකූ බවත් පැහැදිලි කොට කීවෙමි. බුදුරජාණන් වහන්සේ බුදුවන්නට පෙර බෝධිසත්ත්ව බවත්, බෝධිසත්ත්වයන් වහන්සේ මී රැළෙක වුවත් වඳුරු රැළෙක වුවත් උපන්නා නම් ඒ මී රැළ, ඒ වඳුරු රැළ, ඒ මිනිස් රැළ ආරක්ෂා කැර ගන්නට සටන් කළ බවත්, බුදු වන තුරු අප ද අනුග මනය කරන්නේ ඒ බෝධිසත්ත්ව ආදර්ශය බවත් පහදා දුනිමි.

1988-09-04 ඉරිදා ලංකාදීප

**අනේ සිංහලයිනි, සමඟි වන්න...**

සමහර ලොකු වැඩවලදී බිලිපූජාවක් අවශ්‍ය යැයි පුරාණ කථාවක් තිබෙනවා. දැන් ඉන්න ප්‍රධානින් එබන්දක් විශ්වාස නොකරන බව හොඳින් දනිමි. එසේ වුවත් ඒ මිථ්‍යා කථාව අනුව හෝ ජාතික සමඟියේ පදනම වන සිංහල සමඟිය සඳහා බිලිපූජාවක් අවශ්‍ය නම් සිංහල ජාතිය වෙනුවෙන් අහිංසක ව දිවි පුදන්නට දස දහසක් දෙනා සූදානම් වනු ඇත. එසේ අවශ්‍ය නම් හැමට ම ප්‍රථමයෙන් මාගේ ජීවිතය පුදනවා, පුදනවා ම යි.

1982-12-26 රිවිරැස

"ජාතිය මේ සිංහල බුදු සමයෙන් පිට ගිය දා වැනැසෙයි භූපතිනේ" මෙය පුරාණ ගොවීන් කුඹුරු කොටමින් කී කවියෙක පදයෙකි. ''බුද්ධාගම නැති දාට සිංහල ජාතියත් නැත්තට ම නෑ'' යයි කීවේ ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්තුමා ය. බුද්ධාගමෙන් තොර සිංහලයෙක් ද නැත. සිංහලයාට බුද්ධාගමෙන් තොර

කිසිවෙකුත් නැත යනු උගතුන් විසින් පිළිගන්නා ලද සිද්ධාන්තයකි.
මේ හැම කියමනෙකින් ම ප්‍රකාශ වන්නේ සිංහල ජාතියත් බුද්ධාගමත් අතර කොතරම් දැඩි සම්බන්ධයක් පැවතුණා ද, දැන් පවතී ද යන්නයි.

1984-05-13 දවස

**සිංහල බෞද්ධකම රැකගෙන බොදු පිළිවෙත් අනුව රට හදමු.**

''විදේශ රටවල් හදන්න හැදූ සැලසුම් කොපි කිරීමෙන් අපේ රට හදන්න බැහැ. කොහේ වත් ගිහින් සැලසුම් පිළියෙළ කරන්න අපට අවශ්‍ය නැහැ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙහි කියා දෙන ධර්ම සැලැස්ම අනුව සැලැස්මක් සකස් කිරීමෙන් අපේ රට අපට උවමනා විදියට දියුණු කරගන්න පුළුවන්. අතීතයේ අපේ රට පෙරදිග ධාන්‍යාගාරය බවට පත් වෙලා තිබුණේත් ධර්මද්වීපයක් බවට පත් වෙලා තිබුණේත් මුතුන් මිත්තන් සිංහල බෞද්ධකම රැකගෙන බොදු පිළිවෙත් අනුව රට හැදූ නිසයි.''
(බුලත්සිංහල අක්ෂිදාන සංගමයේ 5 වන සාංවත්සරිකෝත්සවයේ දී)

1973-09-19 දවස

**තුරුණු විය ශ්‍රේෂ්ඨව හදා ගනිමු.**

''යුවා චරෙ බ්‍රහ්මචරියං'' 'තරුණයකු නම් බඹසර සැරිය යුතු ය.' මේ උපදේශයෙහි වටිනාකම වැටහෙන්නේ නුවණින් සිතා බැලූ තරමට ය. තරුණකම මහා දිග පළල ඇති දෙයක් නොවේ. අවුරුදු දහ අටෙන් විස්සෙන් තරුණකම ආරම්භ වුණාම තිස්පහ පමණ වන විට අවසන් වේ. වර්තමාන සමාජය දෙස බලන විට අවුරුදු තිස්පහ පසු වී ත් යම් යම් අය ගේ හිත්වලැ තරුණකම් තුබුණත් කයේ නම් නැති තරමට ම පිරිහී ඇති බව පෙනේ. බුදුරජාණන් වහන්සේ ගේ උපදේශය, අවුරුදු 15 ක් පමණ වූ තරුණ කාලය වැරැදි ආකාරයට යෙදුව හොත් අවුරුදු තිස්පහෙන් තරුණකම අවසන් වී අවුරුදු හැත්තෑවක් ජීවත් වන්නට සිදු වූවොත් ඉතිරි අවුරුදු තිස්පහ ම අඳුරු අවාසනාවන්ත වන බව යි. ඉදින් අවුරුදු පසළොසක් පමණ වූ තරුණ කාලය හොඳින් ගත කළොත් ඉදිරියට අවුරුදු සීයක් ජීවත් වන්නට සිදු වුවත් මුළු කාලය ම වාසනාවන්ත, ආලෝකවත් ජීවිතයක් ගත කරන්නට පිළිවන් වන බව යි. මේ උපදේශය වර්තමාන තරුණ - තරුණියනට හොඳින් ම පැහැදිලි කැර දිය යුතු කාලය දැන් එළැඹී ඇත.

1963-05-06 දිනමිණ

**නිවනින් මෙහා...**

'කලින් ආසියාතික රටවලැ කළ සංචාරයෙන් පසු වැ මා බැසගත් නිගමනය, එසේ මැ කළ ප්‍රකාශය යුරෝපයෙහි හා ඇමරිකාවේ දී රටවලැ සංචාරයෙන් පසු වැ නැවත වරක් ලංකාවාසී ජනතාව ඉදිරියෙහි තබනු කැමැත්තෙමි. එනම් නිවනින් මෙහා හොඳ ම තැන ලංකාව බව යි.'

1972-05-08 ලංකාදීප